**සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම - 2020**
**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්කර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 32 ඡේදය ප්‍රකාරව වත්කම්, වගකීම් සහ ආදායම් වියදම් ශේෂයන් හිලව්කළ නොහැකි වුවද, 2011 වර්ෂයේ සෙවනගල ෂුගර් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම රජයට පවරාගන්නා ලද අවස්ථාවේ සිට පැවති පරිගණක පද්ධතියේ දෝෂයක් හේතුවෙන් ලිපිද්‍රව්‍ය, පොහොර සහ වල්නාශක තොගවල එකතුව රු.300,186,439 ක බැර ශේෂ රු.412,530,957 ක් වූ මුළු තොග වටිනාකමට හිලව් කර තොග වටිනාකම රු.112,344,518 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 66 (ඇ) ඡේදය ප්‍රකාරව ගිණුම්කරණ කාලපරිච්ඡේදය අවසානයේ සිට මාස 12 ක් තුළ අයකර ගන්නා වත්කම් පමණක් ජංගම වත්කම් ලෙස වාර්තා කළ යුතු වුවද, සෙවනගල අංශයේ කාර්ය මණ්ඩලයෙන් වසර 02 සිට වසර 05 දක්වා කාලයක් තුළ අයකර ගනු ලබන රු.22,473,699ක ණය මුදලක් ද පැල්වත්ත අංශයේ 2024 අප්‍රේල් 22 දින කල් පිරෙන රු.43,544,918 ක ස්ථාවර තැන්පතුවක්ද සෙවනගල අංශයේ 2022 නොවැම්බර් 28 දින කල්පිරෙන රු.45,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතු 02ක් ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී ගිණුම් වාර්තා තුලින් එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේ සිට මාස 12 ක් තුළ කල්පිරෙන වත්කම් පමණක් ජංගම වත්කම් වශයෙන් වාර්තා කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 හි 07 වන ඡේදය ප්‍රකාරව මාස 03 ක් හා ඊට අඩු කාලයකින් කල් පිරෙන රු.522,603,571 ක් වටිනා සෙවනගල අංශයේ ස්ථාවර තැන්පතු 13 ක් හා පැල්වත්ත අංශයේ රු.396,749,217 ක් වටිනා ස්ථාවර තැන්පතු 4 ක් මුදල් හා මුදල් සමාන දෑ ලෙස වර්ගකර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී පෙන්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් වාර්තා තුළ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මුදල් ප්‍රවාහයන් නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළින් නිරූපනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් කර තිබුණු සෙවනගල අංශයේ රු.243,940,222 ක හා පැල්වත්ත අංශයේ රු.1,065,219,304 ක දේපළ පිරියත හා උපකරණ තවදුරටත් භාවිතයේ පැවතුණු අතර එම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 2011 වර්ෂයේදී ආයතනය රජයට පවරා ගන්නා අවස්ථාව වන විටත් සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ වත්කම් ද ස්ථාවර වත්කම් ලේඛනය තුළ පැවති අතර ඉදිරියේදී වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීමටත්, ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාගමේ පැල්වත්ත අංශය විසින් සේවකයන් හා බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 04 ක් ද, සෙවනගල අංශය විසින් සේවකයන් හා බාහිර පාර්ශවයට එරෙහිව නඩු 20ක් ද පවරා විභාග වෙමින් පැවති අතර බාහිර පාර්ශවයන් හා සේවකයින් විසින් අයුක්ති සහගත ලෙස සේවය අවසන් කිරීම් , නැවත සේවය ඉල්ලීම , සේවා දිගුවක් ඉල්ලීම , ශ්‍රේණි උසස්වීම් ලබාගැනීම , සමාගම රජයට පවරා ගැනීම හේතුවෙන් පරිපාක ස්ප්‍රීතු ලබා ගැනීමට නොහැකි වීම යනාදිය ඉල්ලා සමාගමේ පැල්වත්ත අංශයට එරෙහිව නඩු 02 ක්ද සෙවනගල අංශයට එරෙහිව නඩු 08 ක්ද පවරා විභාග වෙමින් පැවතුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 84, 85 හා 86 ඡේද ප්‍රකාරව එම නඩුවල වර්තමාන තත්ත්වය සලකා බලා මූල්‍ය ප්‍රකාශනවල අසම්භාව්‍ය වගකීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරිමට හෝ නඩු පිළිබඳ විස්තර හෙළිදරව් කිරිමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාළ ගිණුම් වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ නිසා හෙළිදරවු කිරීමට අවස්ථාවක් නොතිබුණි. 2021 වර්ෂයේ ගිණුම් වාර්තා වල එය නිවැරදි කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි නියමයන් ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 117 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කරන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වුවත්, පැල්වත්ත හා සෙවනගල අංශයන්හි පිළිවෙලින් රු.1,261,910,806 ක් හා රු.266,462,262 ක් වූ ගොවි ණය සඳහා පිළිවෙලින් රු.530,481,173 ක් හා රු.9,242,963 ක අඩමාන ණය වෙන් කර තිබුණු අතර කන්තලේ සීනි සමාගමෙන් ලැබිය යුතු රු.6,002,360 ක් හා සුළු ප්‍රමාණයේ උක් වගා කිරීමේ ව්‍යාපෘතියෙන් (SSP) ලැබිය යුතු රු.6,665,725 ක් 2014 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු නොකර එම මුදල ද | අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය ඉදිරි ගිණුම් වාර්තා තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. |

අඩමාන ණය වශයෙන් වෙන්කර තිබුණි. නමුත් එම වෙන් කිරීම්වලට හේතු වූ කරුණු හා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ද මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට කපාහරින ලද සෙවනගල අංශයේ එකතුව රු.80,086,509 ක ආර්ථික සේවා ගාස්තු වටිනාකම සදොස් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගෙවූ බදු ලෙස සටහන් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ගෙවූ ආර්ථික සේවා බදු වටිනාකම වන රු.6,691,840ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මුදල් ප්‍රවාහයන් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත ප්‍රකාරව 2013 වර්ෂයේ දී සෙවනගල ෂුගර් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගමට අයත් සියලුම වත්කම් හා වගකීම් ලංකා සීනි සමාගමට පවරාගත යුතු වුවද සෙවනගල අංශයට අදාළ ඉඩම් හෙක්ටයාර 469.1674ක් පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | මෙතෙක් මෙම ඉඩම් වල අයිතිය ලංකා සීනි සමාගම - සෙවනගල වෙත ලැබී නොමැත. ඒ සඳහා නීතිමය කටයුතු සිදුකෙරෙමින් පවතින බව. | සමාගමට අයත් ඉඩම් හා ගොඩනැඟිලිවල අයිතිය තහවුරු කර ගැනීමටත්, ඒවා ලේඛනගත කර ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | සෙවනගල අංශයේ 2020 දෙසැම්බර් 31 දිනට පවතින වෙනත් තොග භෞතිකව සමීක්ෂණය කර තිබුණද, එම වාර්තාවේ ඇතුළත් සත්‍ය තොගවල වටිනාකම වෙනුවට තොග ලෙජරය අනුව වටිනාකම වූ රු.524,970,955 ක් මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණි. | වසර 35 ට පෙර ආයතනය ආරම්භයේ සිට කම්හල ස්ථාපිත කළ ඉන්දියානු සමාගම විසින් ආයතනය වෙත ප්‍රදානය කළ අයිතමයන් භෞතික තොගය තුළ ඇතුළත් වීම සහ ඒවායේ වටිනාකම් ගණනය කිරීම පිළිබඳ ගැටළු පවතින බව සහ සමාගම රජයට පවරා ගැනීමට තොග අගය කරන අවස්ථාවන්හි දී ඇතැම් අයිතමයන්හි ශුද්ධ අගයන් හඳුනා ගෙන නොමැති වීමෙන් සහ නෛතික අයිතිය පූර්ණ වශයෙන් රජය සතු නොවීම හේතුවෙන් දිගින් දිගටම එම තොගයන් භෞතික තොගය තුළ ඇතුළත් වුවද මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීමට නොහැකි බව. | භෞතික සත්‍යාපන වාර්තාවේ ඇතුළත් තොග ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සෙවනගල අංශයේ තොග සත්‍යාපන වාර්තාවේ ඇතුළත් සුභසාධන මිලට ලබාදීම සඳහා වූ රු.6,108,000ක් වටිනා සීනි කිලෝග්‍රෑම් 55,528 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් වී නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.35,365,825 ක දැව්තෙල් තොගය භෞතික තොග සත්‍යාපනයට ලක්කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සියලුම තොග භෞතික සත්‍යාපනයට ලක්කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කල යුතුය. |
| (ඉ) | 2020 වර්ෂයේ භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව සෙවනගල අංශයේ ගබඩාවන්හි රු.785,662ක් වටිනා තොග අයිතම 207ක ඌනතාවයක් හා රු.506,199 ක් වටිනා තොග අයිතම 150 ක අතිරික්තයක් පැවති අතර භෞතිකව සත්‍යාපනය කරන ලද එහෙත් වටිනාකම ගණනය කළ නොහැකි තොග වර්ග 1250 ක් ද, ප්‍රයෝජනයට ගත නොහැකි හා අපහරණය කළ යුතු රු.2,888,359 ක් වටිනා තොග අයිතම 250 ක් ද ගබඩාවේ පැවති අතර ගිණුම්වල ඒ සම්බන්ධයෙන් ගැළපීම් සිදුකර නොතිබුණි. | මෙම තොග ශේෂයන් සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර පවත්නා නෛතික සීමා මේ සඳහා ද හේතු වී ඇති බව. | තොග සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලනයක් පවත්වා ගනිමින් ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමටත්, භෞතික සත්‍යාපන වාර්තාවේ ඇතුළත් ශේෂය මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපනය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඊ) | සෙවනගල අංශයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ලිපිද්‍රව්‍ය, පොහොර හා වල්නාශක තොගය තුළ රු.9,475,416ක් වටිනා “ Transit Fixed Assets ” නමින් ශේෂයක් 2013 වර්ෂයේ සිට පවතින අතර මේ පිළිබඳව පෙර වර්ෂයන්හිදී ද විගණනය විසින් කරුණු පෙන්වා දෙනු ලැබුව ද, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළද එම වටිනාකම එලෙසම පැවතුණි. | ERP පද්ධතියක් සථාපිත කොට, මේ වන විට එහි මූලික කටයුතු ආයතන තුළ ක්‍රියාත්මක වෙමින් පවති. දැනට භාවිතා කරනු ලබන “ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය” තුල ඇති අඩුපාඩු මඟහරවා ගැනීමට හැකිවන බව. | මතභේදාත්මක ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය වන බැවින් සම්පූර්ණ පරීක්ෂාවක් සිදුකර නිවැරදි තීන්දු තීරණ ගත යුතුය. |
| (උ) | සෙවනගල අංශයේ කෙරීගෙන යන වැඩ වටිනාකම වූ රු.41,273,467ක් ජංගම නොවන වත්කම් යටතේ වෙනම අයිතමයක් ලෙස දැක්වීම වෙනුවට දේපළ පිරියත හා උපකරණ වටිනාකමට එකතු කර එක් අයිතමයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | කෙරීගෙන යන වැඩ දේපළ පිරියත හා උපකරණ යටතේ වෙනම දැක්විය යුතුය. |
| (ඌ) | පැල්වත්ත ඒකකයේ 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.38,764,870 ක මාර්ගස්ථ තොගය තුළ වසර 07කට වැඩි කාලයක් තිස්සේ මාර්ගස්ථව පවතින රු.4,904,160ක තොග අඩංගු වී තිබුණ ද මෙම තොගය පිළිබඳ නිවැරදි තොරතුරු හඳුනාගෙන ගිණුම්වල නිවැරදිකිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම නිරීක්ෂණය පෙර වර්ෂයන්හි ද විගණන වාර්තාවලින් පෙන්වාදෙනු ලැබුව ද ඒ කෙරෙහි නිසි අවධානය යොමු කර නොතිබුණි. | 2014 වර්ෂයට පෙර සිට පවතින මෙම ශේෂය භාණ්ඩවල පිරිවැය අඩුවෙන් ගිණුම්ගත වීම නිසා හටගත් ගිණුම්කරණ දෝෂයක් වන අතර මේ පිළිබඳව තව දුරටත් සොයා බලා ඉදිරියේදී ගිණුම් ගැලපීමට කටයුතු කරන බව. | මෙම භාණ්ඩ ලැබී තිබේද යන්න පිළිබඳව සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | පැල්වත්ත අංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.3,779,454,934 ක් පිරිවැය වූ ක්ෂේත්‍ර යන්ත්‍ර හා උපකරණ (කල් බදු වත්කම් ද සමඟ), වාරිමාර්ග හා විවිධ උපකරණ සහ කර්මාන්තශාලා බලාගාරය හා උපකරණවල ක්ෂය අනුපාතයන් පිළිවෙලින් සියයට 15 ක්, 6 ක් හා 5 ක් වූ අතර යටිතල පහසුකම් (Infrastructure ) සඳහා ක්ෂය අනුපාතයක් සඳහන් කර නොතිබුණි. එසේ වුවද, එම වත්කම් තුළ ඇතුළත් එකතුව රු.1,672,452,689 ක් පිරිවැය වූ වත්කම් ප්‍රමාණයක් සියයට 2 ත් සියයට 50 ත් අතර විවිධ අනුපාතයන් යටතේ ක්ෂය කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම හා ක්ෂය වෙන් කිරීම්වල නිරවද්‍යතාව පරීක්ෂා කළ නොහැකි විය. | 2011 වර්ෂයේ ආයතනය රජයට පවරා ගැනීමේදී පැවති වත්කම් ඒ ආකාරයෙන්ම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත්ව ඇත. පැවති ක්ෂය ප්‍රතිපත්තිය අනුව ක්ෂය අනුපාතවල වෙනස පැවතුණි. ගිණුම්කරණ පද්ධතිය තුළින් අදාළ ප්‍රතිශත වෙනස් කිරීම සිදු කළ නොහැකි හෙයින් ඉදිරියේදී වත්කම් ප්‍රත්‍යාගණනයත් සමඟ ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | ක්ෂය කළ යුතු වත්කම් සඳහා නිශ්චිත ක්ෂය අනුපාතයන් තීරණය කළ යුතු අතර ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව ක්ෂය ගණනය කිරීම සිදු කළ යුතුය. |
| (ඒ) | 2014 ජූනි 30 දින රු.42,529,510 කට මිලදී ගෙන 2018 ජූලි 07 දින ගින්නෙන් විනාශ වී තිබුණු පැල්වත්ත අංශයේ සීනි කැට බවට පත් කිරීමේ “Modification Automation Factory Plant”යන්ත්‍රය සඳහා රක්ෂණ භාර අරමුදලෙන් ඉල්ලුම් කරන ලද රු.40,430,655 ක වන්දි මුදලෙන් 2019 වර්ෂයේදී රු.12,653,693 ක් පමණක් ලැබී තිබුණු අතර එම මුදලින් යන්ත්‍රය අලුත්වැඩියා නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂයක් වශයෙන් 2020 වර්ෂයේදී දක්වා තිබුණු අතර ගිනි හානිය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | දෘඩාංගය හා මෘදුකාංගය සඳහා රු.40,430,655 ක වන්දි මුදල් ඉල්ලුම් කළ ද, මෘදුකාංගය සඳහා වන්දි මුදල් ප්‍රතික්ෂේප වූ බවද 2021 වර්ෂය තුළදී යන්ත්‍රයේ අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇති අතර නව වත්කම ස්ථාපනය කිරීම සම්බන්ධ ගැලපීම හා හෙළිදරව් කිරීම 2021 වර්ෂයේදී සිදු කරනු ලැබේ. මෘදුකාංගයේ පැවති දෝෂයක් හේතුවෙන් යන්ත්‍රයේ ක්ෂය කිරීම නතර කිරීමට නොහැකි විය. 2021 වර්ෂයේදී නිවැරදි කරන බව. | යන්ත්‍රය ක්ෂය කිරීම අත්හිටුවා එය අපහරණයට හෝ අලුත්වැඩියාවට පියවර ගත යුතුය. |
| (ඔ) | සෙවනගල අංශයේ නිල නිවාස දේශපාලනඥයෙක්, විශ්‍රාමික නිලධාරින් දෙදෙනෙක්, පෞද්ගලික ආයතනයක කළමනාකරුවෙක්, රජයේ නිලධාරින් 3 ක් ඇතුළුව 7 දෙනෙකු විසින් පරිහරණය කරනු ලැබුවද නිල නිවාස වලින් එම පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට නිවාස කුලී, ජල හා විදුලිය වියදම් වෙනුවෙන් එම පාර්ශවයන්ගෙන් අයවිය යුතු මුදල රු.1,072,323ක් අයකර ගැනීමට හෝ ලැබිය යුතු මුදල් වශයෙන් ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අනවසර පදිංචිකරුවන් ලෙස ආයතනීය නිල නිවාස වල රැදී සිටින බවද නීතිමය කටයුතු සිදුකෙරෙමින් පවතින බව. | විදුලිය හා ජල ගාස්තු නිලධාරියා විසින් දරාගත යුතු බවත්, සමාගම විසින් ගෙවන ලද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව පැල්වත්ත අංශයේ ලියාපදිංචි අංක සහිත වාහන හා ක්ෂේත්‍රයේ භාවිතා වන යන්ත්‍ර සූත්‍ර 368 ක වටිනාකම එකතුව රු.379,858,648 ක් වුවද , ප්‍රවාහන අංශය විසින් ලබාදුන් තොරතුරු අනුව රු.439,472,361 ක් වටිනා වාහන හා ක්ෂේත්‍රයේ භාවිතා වන යන්ත්‍ර සූත්‍ර 491 ක් පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව රු.59,613,713 ක් වටිනා වාහන හා ක්ෂේත්‍රයේ භාවිතා වන යන්ත්‍ර සූත්‍ර 123 ක් අඩුවෙන් ගිණුම්ගතකර පැවති බව නිරීක්ෂණය විය. | 2011 වර්ෂයේදී ආයතනය රජයට පවරාගන්නා අවස්ථාවේදී සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල පැවති වාහන සහ ක්ෂේත්‍රයේ භාවිතවන යන්ත්‍රසූත්‍ර ඒ ආකාරයෙන්ම ගිණුම් වාර්තා තුල පවතින බවද මෙම වාහන මේ දක්වා භෞතිකව සත්‍යාපනය කර ගිණුම්වාර්තා තුල ගැලපුම්කර නොමැති අතර ආයතනය විසින් අලුතින් මිලදී ගන්නා ලද සියලුම රථ වාහන ගිණුම් වාර්තා තුල පවතින අතර පවරාගත් පැරණි වාහන වල මෙම වෙනස පවතී. ආයතනයේ වත්කම් සත්‍යාපනයක් මේ වනවිට සිදුකරමින් පවතින අතර එය අවසන් වීමෙන් පසු ගිණුම් වාර්තා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සියලුම වාහන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ක) | සෙවනගල අංශය විසින් රු.27,067,812 ක යන්ත්‍රෝපකරණ මිලදී ගනිමින් 2013 වර්ෂයේදී ආරම්භ කර 2014 වර්ෂයේදී නවතා දමා තිබුණු “අපජලය පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය” සහ රු.2,864,444 ක වියදමකින් 2014 වර්ෂයේදී ඉදිකළ භාවිතයට නොගන්නා “නළ ළිං ව්‍යාපෘතිය” අසාර්ථක වී තිබුණු අතර වැය කළ වියදම වසර ගණනාවක සිට කෙරීගෙන යන වැඩ ගිණුමේ දක්වා තිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට අපජල පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය කාර්යන් අවසන් වී නොතිබුණු බවද පර්යේෂණ කටයුත්තක් ලෙස සිදුකරන ලද නළ ළිං ඉදිකිරීම සම්බන්ධයෙන් සිදුකරන විමර්ශනය අවසන් වූ පසු “කෙරීගෙන යන වැඩ ගිණුම ”නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මෙම ව්‍යාපෘතීන් අසාර්ථක වීමට හේතු සොයාබලා එය සක්‍රීය කිරීමට හෝ යමෙකුගේ නොසැලකිල්ලක් වේ නම් එයට එරෙහිව විනය පියවර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ග) | පැල්වත්ත අංශයේ “ණයහිමි පාලන සේවා ගිණුම” හා “ණයහිමි පාලන සැපයුම් ගිණුම ” ලෙස පවත්වාගෙන යන ගිණුම් දෙකක 2020 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.39,971,385ක හා රු.4,691,459 ක ශේෂයන් 2002 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලයට අදාළව නිරවුල් නොකර පැවතුණි. මෙම මතභේදකාරී ගනුදෙනු ගිණුම්කරණ පද්ධති ගැටළු හා වෙනත් හේතු නිසා පැන නැඟී තිබුණ ද නිරවුල් කර ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | මෙම සේවා සැපයුම් කරුවන්ගෙන් නැවත සේවාවන් ලබාගැනීමේදී පැරණි ණය ශේෂයන් ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂාකර එම ණය ශේෂය කපාහැරීමකින් තොරව ඉදිරියට ගෙනවිත් තිබෙන බවද මෙම ශේෂය තහවුරුකර ගැනීමෙන් අනතුරුව අධ්‍යක්ෂක අනුමැතියක් ලබාගැනීමෙන් පසු ගිණුම් වාර්තා වලින් ඉවත්කිරීමට කටයුතු කරන බව. | මෙම ණයහිමියන් සත්‍ය වශයෙන් පවතීද යන්න සොයා බලා සුදුසු පියවර ගත යුතුය. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෙවනගල අංශයේ මුල්‍ය ප්‍රකාශන අනුව ලෙජර් ගිණුම් 11 ක් යටතේ ගොවීන්ගෙන් ලැබිය යුතු මුළු ණය ප්‍රමාණය රු.266,462,262 ක් වුවද ඊට අදාළව ඉදිරිපත් කර තිබූ ගොවි ණය උපලේඛනයේ සහ කාල විශ්ලේෂණයේ එම වටිනාකම් පිළිවෙලින් රු.263,857,771ක් හා රු.264,072,243 ක් විය. ඒ අනුව මුල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමේදී ගොවි ණය උපලේඛනයේ හා කාල විශ්ලේෂණ වාර්තාවේ පිළිවෙලින් රු.2,604,491 ක හා රු.2,390,019 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අය විය යුතු ණය ශේෂය නිවැරදි වන බවද උක් ගොවිණය, ණය ලේඛන හා පවතින වෙනස්වීම් තවදුරටත් පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගොවි ණය ශේෂ නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට සෙවනගල අංශයට අයත් රු.29,416,348ක් වූ වෙළෙඳ ණයහිමි ගිණුම් 97 කට අදාළව ශේෂ සනාථ කිරීම් ලබාගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී වෙළෙඳ ණය හිමියන්ගේ ශේෂය සනාථ කරවා ගෙන විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට වූ පැල්වත්ත අංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නිෂ්පාදිත සීනි මත ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු (NBT) රු.109,138,256 ක් තුළ 2012 – 2016 කාල පරිච්ඡේදයට අදාළව ගෙවිය යුතු රු.92,125,804 ක බදු මුදලක් (NBT) දක්වා තිබුණි. එසේ වුවද, මෙම ගෙවිය යුතු බදු සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත බදු වාර්තා යවා නොතිබුණු බැවින් ගිණුම්වල ඇතුළත් මෙම බදු මුදලේ නිරවද්‍යතාවය විගණනයේදී සෑහීමට පත්විය නොහැකිව තිබුණි. | 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලසීමවට අදාළව රු.92,125,804 ක මුදලක් ගෙවියයුතු ජාතිය ගොඩනැගීමේ බදු ලෙස ගිණුම් වාර්තා තුල ඇති බවද ඊට අමතරව 2019 වර්ෂයේ ඔක්තෝම්බර් සහ නොවැම්බර් මාස වලට අදාළව රු.17,012,452 ක මුදලක් ගෙවීමට ඇති අතර ඒ අනුව 2020 දෙසැම්බර් 31 දින වන විට රු.109,138,256 ක මුදලක් ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු ලෙස ගිණුම් වාර්තා තුල පවතින බව . | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෙවනගල අංශයේ රු.5,062,695 ක අත්තිකාරම් හා කලින් ගෙවීම් යටතේ දක්වා තිබුණු රු.421,910 ක් වසර 01 සිට වසර 05 කට අධික කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වසරේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | නොපිය වූ අත්තිකාරම් පිළිබඳව කඩිනමින් සොයා බලා පියවා ගැනීමටත්, මිලදී ගැනීම් සම්බන්ධ විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇති කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2012 - 2020 අතර කාලය තුළ සමාගමේ අභ්‍යන්තර අංශ වූ කොළඹ ප්‍රධාන කාර්යාලයෙන් හා පැල්වත්ත අංශයෙන් සෙවනගල අංශය වෙත අයවිය යුතු මුදල් නිරවුල් කර නොගෙන පිළිවෙලින් රු.110,497,848 ක් හා රු.851,530,055 ක් සෙවනගල අංශයේ ගිණුම්වල ජංගම වත්කම් යටතේ සම්බන්ධිත පාර්ශවයන් ලෙස දක්වා තිබුණි. | ඉදිරි වසරේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් සම්බන්ධිත රාජ්‍ය හා පෞද්ගලික සමාගම්වලින් හා සීමාසහිත ලංකා සීනි සමාගමේ ඒ ඒ අංශ අතර සිදුවන ගනුදෙනු වලින් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ විස්තරාත්මකව හෙළිදරව් කළ යුතුය. |
| (ඇ) | භාණ්ඩ හා උපකරණ ආනයනය කිරීම සඳහා සෙවනගල අංශය විසින් සැපයුම්කරුවන්ට අවස්ථා 39 කදී ලබාදුන් රු.8,233,150 ක අත්තිකාරම් සඳහා වසර 4 සිට 8 දක්වා කාලයක් ගතවී තිබුණද විගණන දින වන විටත් එම අත්තිකාරම් පියවා නොතිබුණි. එම නොපියවූ අත්තිකාරම් ශේෂය තුළ 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ අවස්ථා 21 කදී භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම සඳහා ගෙවන ලද රු.509,808 ක භාණ්ඩ නිදහස් කිරීමේ ගාස්තු, ප්‍රවාහන ගාස්තු හා රක්ෂණ ගාස්තු ද ඇතුළත් වී තිබුණි. | මේ පිළිබඳව විශේෂ අවධානය යොමුකර ගෙවා ඇති අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | නොපියවූ අත්තිකාරම් පිළිබඳව කඩිනමින් සොයා බලා පියවා ගැනීමටත්, මිලදී ගැනීම් සම්බන්ධ විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇති කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෙවනගල අංශයේ ගිණුම්වල 2020 දෙසැම්බර් 31 දිනට වෙළෙඳ ණයහිමියන් රු.5,492,069 ක් වසර 02 ක සිට වසර 07 ක් දක්වා ද, විවිධ ණයහිමියන් රු.1,055,351 ක් වසර 04 කට වඩා වැඩි කාලයක සිට ද, උක් ගොවීන්ට ගෙවිය යුතු රු.61,322,678 ක් වසර 8කට වැඩි කාලයක සිට ද නිරවුල් කිරීමට කටයුතු නොකර ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවැතුණි. | 2011 වසරේදී සෙවනගල ආයතනය රජයට පවරා ගැනීමෙන් පසු උක් ගොවින් ආරක්ෂා කර ගැනීමේ අරමුණින්, 2011 වසරේ දී උක් සැපයුම වෙනුවෙන් උක් ගොවීන් වෙත ගෙවිය යුතුව තිබූ ගෙවීම් ගණනය කිරීමට සිදුවූ අතර 2011 වසරේ දී එම ගණනය සිදු කිරීමේ දී උක් ගොවීන්ගෙන් අයවිය යුතුව තිබූ රු.59,792,499 ක ණය ප්‍රමාණයක් අය කරගෙන ඉතිරි මුදල් ගෙවීම් කර ඇති බවද එම ණය අය කිරීම් පෞද්ගලික පාලන සමයට අදාල වන අතර මෙම ගෙවිය යුතු ශේෂයන්, සෙවනගල ආයතනයට එරෙහිව පවතින නඩු කටයුතු අවසන් වූ පසු ලැබීම් හා ගෙවීම් වශයෙන් නිරවුල් කර ගැනීමේ හැකියාව ඇති බව සහ උක් පර්යේෂණ ආයතනය ගෙවීමට නියමිතව තිබූ රු.1,500,179 ක් වන මුදල් මේ වන විට ගෙවීම් සිදුකර ඇති බව. | නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (අ) වගන්තිය පැවරී ඇති බලතල ප්‍රකාරව අමාත්‍යවරයා විසින් 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද නියෝගයන්හි 1 කොටසෙහි 30 වන නියෝගය | සීනි නිෂ්පාදනය හෝ සීනි පිරිපහදු කිරීම සම්බන්ධයෙන් සෙවනගල කර්මාන්තශාලාව සඳහා වාර්ෂික පාරිසරික බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | 2019 වර්ෂය අවසානය දක්වාම සීනි කර්මාන්තශාලාව හා ස්කාගාරය සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. සීනි කර්මාන්තශාලාවෙන් පිටවෙන බැගැස් පරිසරයට එක් නොවී ඒවා එකතු කර ඉවත් කරන තාක්ෂණික ක්‍රමවේදයක් ස්ථාපිත කරන ලද අතර ස්කාගාරය ආශ්‍රිතව කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් 2022 වර්ෂයේදී ආරම්භ කිරීමෙන් පසුව පරිසර බලපත්‍රය ලබාගත හැකි බව. | පරිසර ආරක්ෂණ ක්‍රමවේදයන් ස්ථාපිත කර පනත ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (I) | II පරිච්ඡේදයේ 9.1 ඡේදය | රජයේ සේවයෙන් විශ්‍රාම ගිය තැනැත්තෙකු රජයේ සේවයේ තනතුරක නැවත සේවයේ යෙදවීමට හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ යෙදවීමට හෝ අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද අදාළ අනුමැතීන් ලබාගැනීමෙන් තොරව අභ්‍යන්තර විගණන උපදේශකවරයෙකු, කර්මාන්තශාලා උපදේශකවරයෙකු හා ක්‍රියාකාරී ලේකම් උපදේශකවරයෙකු පත්කර තිබුණි. සමාගමට අදාළව බඳවාගැනීමේ පරිපාටියක් හා සේවක සංඛ්‍යාව භාණ්ඩාගාරය ලවා අනුමත කරවාගෙන නොමැති හෙයින් මෙම තනතුරුවල අවශ්‍යතාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | ක්‍රියාකාරී ලේකම් උපදේශකවරයාගේ සේවය 2022.08.30 දින සිට නතර කිරීමට කටයුතු කර ඇත. අභ්‍යන්තර විගණන උපදේශකවරයාගේ සහ කර්මාන්තශාලා උපදේශකවරයාගේ සේවය ඉදිරි කාලයේදී අදාළ ස්ථිර තනතුරු වල පුරප්පාඩු පිරවීමෙන් පසුව නතර කිරීමට කටයුතු කරන බව. | ස්ථිර තනතුරු වලට අදාළ පුරප්පාඩු පිරවිය යුතුය. |

(II) **XIX පරිච්ඡේදයේ**

| | | | |
|---|---|---|---|
| i. 6.2 ඡේදය | සෙවනගල අංශයේ සේවයේ යෙදී සිට විශ්‍රාම ගිය නිලධාරීන් 36 දෙනෙකු නිල නිවාස ආපසු භාර නොදී 2022 අගෝස්තු 31 විගණිත දින වන විටත් අනවසරව පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය. විශ්‍රාම යන අවස්ථාවලදී නිල නිවාස ආපසු භාර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී තිබුණි. තවද පැල්වත්ත අංශයේ සේවයෙන් විශ්‍රාමගත් සේවකයන්ට ලබාදී තිබුණු නිල නිවාස 8 ක් ආපසු භාර නොදී ඒවායේ විදුලි බිල්පත් ද සමාගම විසින් දරා තිබුණි. | පැල්වත්ත ඒකකය විසින් විශ්‍රාම ගිය සේවකයින් සඳහා ලබාදී ඇති නිවාස 08 ක ප්‍රමාණයෙන් නිවාස 2 ක් මේවන විට ආයතනයට ලබාගෙන ඇති බවද තවත් නිවාස 2 ක් ලබාගැනීම සඳහා නඩු පවරා ඇති බවද තවත් නිවාස 2 ක් විශේෂ සේවා ඇගයීමක් ලෙස ගිවිසුම් මගින් ලබාදී ඇති බව සහ ඉතිරි නිවාස දෙකෙහි සිටින පාර්ශවයන්ද ආයතනය සමග නඩු කටයුතුවලට සම්බන්ධ අය වන බව. | සේවකයන් විශ්‍රාම යාමේදී නිල නිවාසවලින් ඉවත් කිරීමේ ක්‍රමවේදයන් සකස් කිරීමටත්, දැනට සිටින විශ්‍රාමිකයින් ඉවත් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ii. 5.1 ඡේදය | පැල්වත්ත අංශයේ නිලධාරීන්ට ලබා දුන් නිල නිවාස 520 ක් තිබුණු නමුත් එම, නිල නිවාස භාවිතා කරන නිලධාරීන්ගෙන් සහ සේවකයන්ගෙන් නිවාස කුලිය අය කර නොතිබුණි. | ආයතනයේ සේවකයින් හට නොමිලේ නිල නිවාස ලබාදීම ආයතනයේ ආරම්භයේ සිටම සිදු කර ඇත. 2011 නොවැම්බර් මස ආයතනය රජයට පවරා ගැනීමේදී සේවකයන්හට ලබා දී තිබූ සියලුම වරප්‍රසාද ඒ ආකාරයෙන්ම ලබා දෙන බවට ආයතනයේ කළමනාකාරීත්වය ලිඛිතව එකගවී සේවකයින් ලංකා සීනි සමාගමට අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මේ දක්වාම නොමිලේ නිල නිවාස ලබා දීම සිදු කරයි. නිල නිවාස නඩත්තු කිරීම පෙර සිටම මේ දක්වාම ආයතනය විසින් සිදුකරන බව. | නිවාස කුලී සහ නිවාසවල අලුත්වැඩියා වියදම් නිලධාරියා විසින් දරාගත යුතු අතර සමාගම විසින් ගෙවන ලද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| iii. 5.2 ඡේදය | සෙවනගල අංශය රජයට පවරා ගැනීමට පෙර මාසයකට රු.20 ත් රු.85 ත් අතර අය කරනු ලැබූ නිවාස කුලී ගාස්තු වසර 11 කට අධික කාලයක සිට මේ දක්වා සංශෝධනය කර නොතිබුණි. | ඉදිරියේදී නිල නිවාස සඳහා කුලී අයකිරීම සම්බන්ධව ආයතනයේ කළමනාකරණ රැස්වීමේදී සාකච්ඡා කල අතර අයකළ යුතු කුලී මුදල් සම්බන්ධයෙන් රජයේ තක්සේරු ආයතනයේ සහාය ලබා ගැනීමට තීරණය කරන ලද බව. | වර්තමානයට ගැළපෙන පරිදි නිවාස කුලිය සංශෝධනය කළ යුතුය. |
| iv. 5.8 ඡේදය | ජල බිල්පත් හා විදුලි බිල්පත් නිලධාරියා විසින් ගෙවිය යුතු වුවද ,සෙවනගල අංශයේ ජල පරිභෝජනය ඒකක 60 කට වැඩියෙන් භාවිතා කර ඇති අවස්ථාවලදී පමණක් නිලධාරියාගෙන් ගාස්තු අයකර ගැනීමත්, විදුලි පරිභෝජනය සඳහා මාසිකව රු. 250 ක සහනයක් ලබාදීමෙන් පසු ඉතිරි විදුලි බිල වැටුපෙන් අයකර ගැනීමත් තුළින් සමාගම විසින් පිරිවැය දැරීමේ ක්‍රම වේදයක් අනුගමනය කර තිබුණි. ඒ අනුව 2020 වර්ෂයේ නිලධාරින්ගේ නිල නිවාසවල විදුලි ගාස්තු ලෙස රු.763,660 ක් සමාගම විසින් දරා තිබුණි. තවද පැල්වත්ත අංශයේ කර්මාන්ත ශාලාව, කාර්යාලය හා නිල නිවාස 564 ක් සඳහා එක් පොදු විදුලි මනුවක් භාවිතා කර තිබුණු අතර ඊට අදාළව 2020 වර්ෂයේ විදුලිය ඒකක 2,416,931 ක් සඳහා සමාගම දරා තිබුණු විදුලි වියදම රු.38,769,975 ක් විය. එසේම පැල්වත්ත අංශයට කිලෝමීටර් කිහිපයක් දුරින් යාලබෝව පිහිටි විධායක නිල නිවාස සඳහා වෙන්වෙන්ව විදුලි මනු තිබුණු නමුත් එම නිල නිවාස වෙනුවෙන් 2020 වර්ෂයේ ජල ගාස්තු රු.81,591 ක් හා විදුලි ගාස්තු රු.253,607 ක් සමාගම විසින් දරා තිබුණි. | සෙවනගල ඒකකය අතීතයේ සිටම සේවකයින් වෙත ජල බිල්පත් හා විදුලි බිල්පත් සඳහා සහනයක් ලබාදී ඇති බව සහ පැල්වත්ත ඒකකයේ ආයතන පරිශ්‍රය තුල පිහිටි සියලු නිල නිවාස සඳහා විදුලිය සපයනු ලබන්නේ සිනි කර්මාන්තශාලාව සඳහා ලබාගෙන ඇති පොදු විදුලි මනුව මගින් වන අතර මෙම නිවාස සඳහා ආයතනයේ ජල පිරිපහදුවක් මගින් නොමිලේ ජලය සපයන අතර වෙන වෙනම මීටර් සවිකර නැති බවද පැල්වත්තට අයත් යාලබෝව ප්‍රදේශයේ ඇති නිල නිවාස සඳහා වෙන වෙනම විදුලිය හා ජල මෙනු සවි කර ඇති බවද නිල නිවාස මෙන්ම ජලය සහ විදුලියද පෙර සිටම සේවක වරප්‍රසාදයක් ලෙස නොමිලේ ලබාදී ඇති බවද මේ සඳහා මුදල් අය කිරීම සම්බන්ධව ඉහත කළමනාකරණ රැස්වීමේදී සාකච්ඡා කළ බව. | විදුලිය හා ජල ගාස්තු නිලධාරියා විසින් දරාගත යුතුය. සමාගම විසින් ගෙවන ලද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 සංශෝධිත ඡේදය | රු.මිලියන 10ක් දක්වා වූ ප්‍රසම්පාදන පමණක් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ යුතු වුවද පැල්වත්ත අංශයේ හා සෙවනගල අංශයේ එකතුව රු.153,400,390 ක් වූ මිලදී ගැනීම් අවස්ථා 07ක්ද රු.66,882,405 ක් වූ මිලදී ගැනීම් අවස්ථා 4 ක්ද යොමුගත මාර්ගෝපදේශයට අනුකූල නොවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය යටතේ සිදු කර තිබුණි. | දැනට මිලදී ගැනීම් සිදුකරන විට යොමුගත මාර්ගෝපදේශයන්ට අනුකූල වන පරිදි සිදුකරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක PED/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (I) | 8.2.2 ඡේදය | අතිරික්ත අරමුදල් ස්ථාවර තැන්පතු වල ආයෝජන කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකගහතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද සෙවනගල අංශයේ 2020 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු 26 ක ආයෝජිත රු.1,097,463,943 ක් සඳහා අදාළ එකගතාවය හා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ස්ථාවර තැන්පතු වල අතිරික්ත අරමුදල් ආයෝජනය කර ඇති බව. | අතිරික්ත අරමුදල් ස්ථාවර තැන්පතු වල ආයෝජන කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකගහතාවය ලබාගත යුතුය. |
| (II) | 8.3.3 (අ) ඡේදය | ආයතනයකට ප්‍රසාද දීමනා හා දිරි දීමනා ලබා ගැනීමට නම් මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබිය යුතු වුවද එම අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කොළඹ ප්‍රධාන කාර්යාලය, සෙවනගල අංශය සහ පැල්වත්ත අංශය සඳහා 2020 වර්ෂයේදී රු.163,848,135 ක දිරි දීමනා ගෙවීම්කර තිබුණු අතර සෙවනගල අංශය හා කොළඹ ප්‍රධාන කාර්යාලය සඳහා 2020 වර්ෂයේදී රු.17,347,859 ක ප්‍රසාද දීමනා ද ගෙවීම්කර තිබුණි. | සේවක සහ වෘත්තීය සමිතිවල ඉල්ලීම් මත අධ්‍යාක්‍ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන දිරිදීමනා ගෙවීම 2013 වසරේ සිටම සිදුකර ඇති බව. | දිරි දීමනා ගෙවීමට පෙර භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (III) | 9.3 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කරවාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව නිලධාරින් බඳවාගෙන තිබුණි. 2019 වර්ෂයේදී කාර්ය මණ්ඩලය 933 ක් වූ අතර 2020 වර්ෂයේදී එය 1070 ක් විය. ඒ අනුව පවත්නා තනතුරු සංඛ්‍යාව, බඳවාගත් හා උසස්වීම් ලබා දුන් ක්‍රමවේදය හා වැටුප් පරිමාණයන්හි නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය. | ආයතනයට මේ දක්වා අනුමත කරගත් පිරිස්බල සැලැස්මක් හෝ බඳවා ගැනීමේ පටිපාටියක් නොතිබූ අතර 2022/2023 වර්ෂයේ දී ආයතනය විසින් පිරිස්බල සැලැස්මක් සකස්කර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් ලබාගෙන කළමනාකරන සේවා මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමුකර ඇති බව. | සමාගම සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අනුමත කරවා ගත යුතු අතර සියලු බඳවා ගැනීම් ඊට අනුකූලව සිදු කළ යුතුය. |
| (ඉ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 (2) ඡේදය | සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය, යෝජිත ප්‍රධාන ආයෝජන, ධාරිතාව පුළුල් කිරීම, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, ණය ආපසු ගෙවීමේ සැලැස්ම, මානව සම්පත් සංවර්ධන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | පැල්වත්ත ඒකකය විසින් 2020 වර්ෂය සඳහා අයවැය ලේඛනය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇති බව. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ඊ) | 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (I) | 3.1 ඡේදය | යොමුගත චක්‍රලේඛය අනුව නිලධාරීන්ට හිමි ඉන්ධන ප්‍රමාණයට අමතරව ප්‍රධාන මෙහෙයුම් නිලධාරීගේ ආයතනික චක්‍රලේඛ මගින් සෙවනගල අංශයේ නිල වාහන වෙන් කළ නිලධාරීන්ට එම නිල රථ ඔවුන්ගේ පුද්ගලික ගමන් සඳහා මාසිකව කිලෝමීටර් 960 – 1750 ක් දක්වා ප්‍රමාණයක් ධාවනය කිරීමට ඉඩ ලබා දී තිබුණු අතර නිලධාරින් 07 දෙනෙකුගේ පෞද්ගලික ගමන් සඳහා 2020 වර්ෂයේදී දැරූ එම ඉන්ධන වියදම රු.1,326,844 ක් වූ අතර 2021 වර්ෂයේදී එම අගය රු.1,533,716 ක් විය. තවද නිල වාහන හිමි නිලධාරීන්ට සිය ඉන්ධන සීමාව ඉක්මවා සෙවනගල අංශයේ රාජකාරී ගමන් සඳහා 2020 වර්ෂයේ දී රු.453,068 ක් වැඩිපුර වියදම්කර | චක්‍රලේඛ හා විධිවිධාන අනුව අදාළ නිලධාරීන් වරප්‍රසාද ලබා ඇත. විශේෂයෙන්ම ආයතනය දුර බැහැර දුෂ්කර පළාතක පිහිටා ඇති බැවින් එවැනි ස්ථානයක සේවය කිරීමට දිරිගැන්වීමක් ලෙස නිලධාරීන්ට මෙම වරප්‍රසාද ලබා දී ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | තිබුණු අතර 2021 වර්ෂයේදී ද සීමාව ඉක්මවූ ඉන්ධන වියදම රු.667,381 ක් විය. | | |
| (II) | 3.8 ඡේදය | නිල වාහන හිමි නිලධාරීන්ගේ පුද්ගලික ගමන් සඳහා රියදුරන්ට ගෙවන අතිකාල හා අනෙකුත් ඒකාබද්ධ දීමනා අදාළ නිල වාහන හිමි නිලධාරීන් විසින් දැරිය යුතු වුවද, සෙවනගල අංශයේ නිලධාරීන්ගේ පුද්ගලික ගමන් සඳහා යොදාගත් සමාගමේ නිල රථ සඳහා රියදුරන්ගේ යැපීම් දීමනා, ලැඟුම් දීමනා හා අතිකාල දීමනා ලෙස සමාගම විසින් 2020 වර්ෂයේ රු.868,975ක් වියදම් කර තිබුණි. 2021 වර්ෂයේද නිලධාරීන්ගේ පෞද්ගලික ගමන් වෙනුවෙන් රියදුරන් වෙත ගෙවූ එම වියදම රු.418,500 ක් විය. 2020ට පෙර වර්ෂයන් හී එම විස්තර ඉල්ලා තිබුණු නමුත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2022/01/01 දින සිට PED 1/2015 දරන චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් වෙත දැණුවත් කර ඇත. පුද්ගලික ගමන් සඳහා නිල වාහන වෙන්කර මාසිකව ඉන්ධන ලබාදීම අත්හිටුවා ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන චක්‍රලේඛයේ 2.1 ඡේදය | 2020 ජනවාරි 31 දිනට පෙර රජයේ සියලු ආයතන රජයේ විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ ලියාපදිංචි විය යුතු වුවද, සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම ඉ-ප්‍රසම්පාදනයන් සඳහා ලියාපදිංචි වී නොතිබුණි. | රජයේ විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ ලියාපදිංචි වීමට කටයුතු කරන බව. | රජයේ විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ ලියාපදිංචි විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,171,901,614 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.1,362,373,144 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,534,274,758 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විකුණුම් මිල වැඩිවීම හේතුවී ඇත.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එතනෝල් විකුණුම් මිල විධිමත් ක්‍රමවේදයකින් තොරව ලීටරයක් රු.500 ක් හා රු.550 ක් වශයෙන් වරින්වර සභාපති විසින් මිල ගණන් තීරණය කර 2020 වර්ෂයේදී එතනෝල් ලීටර් 9,774,282 ක් අලෙවි කර රු.4,739,495,500 ක ආදායමක් උපයාගෙන තිබුණි. එම වර්ෂයේදී එක සමාන නිෂ්පාදන සිදු කරන තරඟකාරී ආයතන විසින් එතනෝල් ලීටරයක් රු.683 හා රු.700 යන මිල ගණන් යටතේ අලෙවි කර තිබුණු ද නියමිත මිල ප්‍රතිපත්ති අනුගමනය නොකිරීම නිසා සමාගමට එම ආදායම අහිමි වී තිබුණි. | වෙළඳපොල තුල සමාගමේ එතනෝල් සඳහා ඇති ඉල්ලුම පාදක කරගනිමින් සමග විසින් තම නිෂ්පාදන අලෙවි කර ගැනීමට හැකිවන ලෙස තරගකාරී මිලක් තීරණය කර ඇත. පෙර වසරේදී එය රු. 300 ට වඩා පහලින් පැවතුණු අතර 2020 වසරේදී රජය විසින් එතනෝල් ආනයනය අත්හිටවූ අතර එම තත්වය යටතේ ද එම මිලට එතනෝල් අලෙවි කිරීම දැඩි අභියෝගකාරී වී ඇති බව. | විධිමත් ක්‍රමවේදයක් යටතේ විකුණුම් මිල තීරණය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සමාගමේ සැලසුම්ගත ඉලක්කයන් හා තත්‍ය කාර්යසාධනය සම්බන්ධයෙන්, | | |
| (i) | ඇස්තමේන්තුගත සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 54,645 ක් වුවද, තත්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 39,697 ක් වීමෙන් ඉලක්කගත නිෂ්පාදනයට ලඟා නොවූ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 14,948 ක් හෙවත් සියයට 27 ක් විය. | මෙම වර්ෂයේදී අපේක්ෂිත නිෂ්පාදන ප්‍රමාණයට වඩා සීනි මෙ.ටොන් 5,372 ක් පමණ අඩුවෙන් නිපදවා ඇති බවද මෙයට හේතුව අපේක්ෂිත උක් සැපයුම මෙ.ටොන් 375,000 ක් වුවත් කර්මාන්තශාලාව සඳහා සැපයීමට හැකිවී ඇත්තේ මෙ.ටොන් 323,106 ක ප්‍රමාණයක් වීම බවද එමෙන්ම අපේක්ෂිත සීනි උකහාගැනීමේ අනුපාතය ද 7.72% සිට 7.30% දක්වා පහත වැටී ඇති අතර මේ සඳහා බලපා ඇති මූලික හේතුව ලෙස නිසි වෙලාවට පොහොර ලබාගැනීමට නොහැකි වූ අතර සෙවනගල අංශය සඳහාද මෙම ගැටලු බලපා ඇති බව. | නිෂ්පාදන ධාරිතාවය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ii) | වර්ෂයේ උක් ඇඹරීමේ අපේක්ෂිත ප්‍රමාණය මෙට්‍රික් ටොන් 677,322 ක් වුවද තත්‍ය වශයෙන් ඇඹරූ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 567,563 ක් වූයෙන් මෙට්‍රික් ටොන් 109,759ක් හෙවත් සියයට 16 කින් සැලසුම්ගත ප්‍රමාණයට ලඟා වීමට නොහැකි වී තිබුණි. | මෙම වර්ෂයේදී උක් මෙ.ටොන් 51,896 ක් පමණ අඩුවෙන් සැපයුම් කර ඇත. 2019, 2020 වර්ෂ තුල රටේ විශාල වශයෙන් පොහොර හිඟයක් පැවති අතර වී ගොවිතැනට පමණක් පොහොර නිකුත් කිරීමට රජය තීරණයකර තිබුණු බවද ඒ අනුව උක් වගාව සඳහා පොහොර යෙදීම සීමාවීම නිසා ඒකක වපසරියකින් ලබා ගන්නා ලද උක් අස්වැන්න විශාල වශයෙන් අඩු වූ අතර මීට අමතරව වන අලි හානිය සහ උක් | උක් සැපයුම හා සීනි ප්‍රතිශතය වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වගාවේ හටගෙන අති සුදුපත්‍ර රෝගය වැනි කරුණුද මෙම වර්ෂවලදී උක් සැපයුම අඩුවීමට හේතු බවද සෙවනගල අංශය සඳහාද මෙම ගැටලු බලපා ඇති බව. | |
| (iii) | සමාගමේ පසුගිය වර්ෂ 05 ක වාර්ෂික සීනි නිෂ්පාදනය පිළිබඳ දත්ත පරීක්ෂාවේදී වැඩිම සීනි නිෂ්පාදනය ලෙස සීනි මෙට්‍රික් ටොන් 51,422 ක් 2016 වර්ෂයේදී වාර්තා වී තිබුණද, ප්‍රවර්තන වර්ෂයේදී එය මෙට්‍රික් ටොන් 39,697 ක් දක්වා පහත වැටී තිබුණි. ඒ අනුව 2016 වර්ෂය හා සැසඳීමේදී ප්‍රවර්තන වර්ෂයේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 11,725 කින් එනම් සියයට 23 කින් අඩු වී තිබුණි. | 2016 වර්ෂයේ සිට 2020 දක්වා සීනි නිෂ්පාදනය පිළිබඳව සලකා බැලීමේදී සීනි නිෂ්පාදනය ක්‍රමානුකූලව අඩු වී තිබීමට හේතු වී ඇත්තේ 2016 වර්ෂයට සාපේක්ෂව 2017,2018,2019,2020 යන වර්ෂයන්හි දී කර්මාන්තශාලාව වෙත ලැබී ඇති උක් ප්‍රමාණය අඩු අගයක පැවති බවද එමෙන්ම සීනි උකහාගැනීමේ ප්‍රතිශතයද 2016 වර්ෂයට සාපේක්ෂව අඩුවී ඇති බව. | නිෂ්පාදන ධාරිතාවය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (iv) | වාර්ෂික එතනෝල් නිෂ්පාදනය පිළිබඳ වූ දත්ත පරීක්ෂාවේදී 2016 වර්ෂයේදී එතනෝල් ලීටර් 11,917,279 ක් ද, 2017 වර්ෂයේදී ලීටර් 7,045,223 ක් ද, 2018 වර්ෂයේදී ලීටර් 9,787,942ක් ද, 2019 වර්ෂයේදී ලීටර් 5,212,559 ක් ද වූ අතර 2020 වර්ෂයේ නිෂ්පාදනය ලීටර් 8,813,623 ක් විය. ඒ අනුව 2016 වර්ෂය හා සැසඳීමේදී 2020 වර්ෂයේ නිෂ්පාදනය ලීටර් 3,103,656 කින් හෙවත් සියයට 26කින් අඩුවී ඇති බවට නිරීක්ෂණය විය. | එතනෝල් නිෂ්පාදනය රඳා පවතින්නේ ඒ සඳහා ඇති ඉල්ලුම සහ අයතනය සතු මොලැසස් තොග මත බවද අප ආයතනය විසින් නිෂ්පාදනය කරනු ලබන එතනෝල් සඳහා ඇති ඉල්ලුම 2016 වර්ෂයට සාපේක්ෂව අනෙකුත් වසර වලදී අඩුවීමක් දක්නට ඇති අතර 2019 වර්ෂයේදී එම තත්වය වැඩි වශයෙන් බලපා ඇති බවද එමෙන්ම මොලැසස් තොග නොමැති වීම හේතුවෙන් සමහර වර්ෂ වලදී නිෂ්පාදනය නතර කිරීමට ද සිදුවූ අවස්ථා තිබෙන බවද 2016 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී එතනෝල් නිෂ්පාදනය පහත වැටුන ද 2020 වර්ෂයේදී එතනෝල් ආනයනය නතර කිරීමත් සමග 2021 වන විට නැවතත් වැඩිකර ගැනීමට සමත්වී ඇති බව. | නිෂ්පාදන ධාරිතාවය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (v) | සමාලෝචිත වර්ෂයේදී සෙවනගල කර්මාන්තශාලාවේ ඇඹරුම් ධාරිතාවය පැය 6,009 ක් වුවද, තත්‍ය ඇඹරුම් කාලය පැය 3,860 ක් විය. උක් දඬු හිඟ වීම, කර්මාන්තශාලාව අක්‍රිය වීම යනාදී කරුණු මත පැය 2,149 ක් කර්මාන්තශාලාව ක්‍රියාත්මක වී නොතිබීම නිෂ්පාදනය අඩුවීම කෙරෙහි බලපා තිබුණි. | ඉදිරියේදී නිෂ්පාදනය වැඩිකර ගැනීමට කටයුතු කරන බව. | උක් සැපයුම වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (vi) | සමාගමට අයත් උක් වගා කළ හැකි මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 14,168 ක් වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට වගා කර | මෙහිදී ආයතනය විසින් වගාකරන ඉඩම් සහ ජනාවාස ගොවි ඉඩම් සම්බන්ධව ආයතනයට සෘජුවම | මුළු ඉඩම් ප්‍රමාණයම වගා කිරීම කෙරෙහි අවධානය යොමු කළ |

| | | | |
|---|---|---|---|
| | තිබූ මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 12,785 ක් වීමෙන් භාවිතයට නොගත් භූමි ප්‍රමාණය හෙක්ටයාර 1,383 ක් බව නිරීක්ෂණය විය. | මැදිහත්විය හැකි වුවද පිටස්තර ගොවි ඉඩම් සම්බන්ධයෙන් ආයතනයට බලපෑම් කළ නොහැකි බවද පිටස්තර ගොවීන් ආයතනයෙන් ලබාදෙන පොහොර සහනාධාර, උක් මිල වැඩිකිරීම ආදිය සලකා බලා උක් වගාවට අවතීර්ණ වන අතර ඊට වඩා වාසිදායක වන වෙනත් වගාවන් පවතිනම් උක් වගාවෙන් ඉවත් වන බවද මේ අනුව වගාකරන ලද බිම් ප්‍රමාණය වෙනස්වීම සිදුවන්නේ පිටස්තර ගොවි අංශය තුල වන අතර එමෙන්ම කිසිදු අවස්ථාවක ආයතනයේ සියලුම ඉඩම් වගාකිරීම ප්‍රයෝගිකව සිදු කල නොහැකි බව. | යුතුය. |
| (vii) | සීනි නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්තශාලාවේ යන්ත්‍ර තුළට ඇතුළත් කරන උක් දඬුවල පවතින සීනි ප්‍රමාණය 2016 වර්ෂයේ දී සෙවනගල හා පැල්වත්ත අංශයේ පිළිවෙළින් සියයට 7.3 හා 10.62 සිට සමාලෝචිත වර්ෂයේදී එය සියයට 6.53 හා 9.50 දක්වා අඩු වී තිබුණි. සීනි උකහා ගැනීමේ ප්‍රතිශතයද, 2016 වර්ෂයේදී සියයට 7.3 ක් හා 8.2 ක් වුවද ප්‍රවර්තන වර්ෂය වන විට පිළිවෙළින් සියයට 6.59 ක් හා 7.3 ක් දක්වා ක්‍රමයෙන් අඩු වී තිබුණි. | වියළි කාලගුණික තත්ත්වය හමුවේ හදිසි ගිනිගැනීම් ඇතිවීම 2016 වර්ෂයට වඩා වැඩි ප්‍රමාණයක් පිලිස්සුනු උක් දඬු කම්හලට යොමු කිරීමට සිදුවූ අතර Covid - 19 වසංගතය හේතුවෙන් නෙලන ලද උක් දඬු නියමිත කාලය තුල කම්හලට පැමිණීම ප්‍රමාදවීම හා එවකට පැවති වර්ෂාපතන රටාව බලපෑ බව. | සීනි ප්‍රතිශතය වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (viii) | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා හෙක්ටයාර එකක් සඳහා උක් ඵලදාව ක්‍රමයෙන් පහළ යමින් පැවතුන අතර සෙවනගල හා පැල්වත්ත අංශයන්හි පිළිවෙළින් 2018 වර්ෂයේ මෙට්‍රික් ටොන් 85 ක් හා 49 ක් වූ උක් ඵලදාව සමාලෝචිත වර්ෂය වන විට මෙට්‍රික් ටොන් 78 ක් හා 38ක් දක්වා ක්‍රමයෙන් පහළ ගොස් තිබුණි. | හෙක්ටයාර එකක් සඳහා උක් ඵලදාව අඩුවීමට බලපාන ලද හේතු ලෙස, දේශීය වෙළෙඳ පොලෙහි පැවති පොහොර හිඟය හේතුවෙන් උක් වගාව සඳහා යොදන ලද පොහොර ප්‍රමාණ අඩු වූ අතර වියළි කාලගුණික තත්ත්වය සහ පැවති වර්ෂාපතන රටාව බලපෑ බව. | උක් ඵලදාව වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ix) | කර්මාන්තශාලාවට අවශ්‍ය බලශක්තිය සීනි නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉවතලන බැගෑස් ආධාරයෙන් නිපදවන අතර, එය ප්‍රමාණවත් නොවූ පසු විකල්ප ප්‍රභවයන් යොදා ගනිමින් යන්ත්‍ර ක්‍රියාත්මක කරයි. කර්මාන්තශාලා බලශක්ති උත්පාදනය 2016 වර්ෂයේදී මෙගාවොට් 15,682 ක් දක්වා ඉහළ ගොස් තිබුණද, ප්‍රවර්තන වර්ෂය වන විට එය මෙගාවොට් 12,579 දක්වා අඩුවී තිබුණද උක් ඇඹරීම අඩුවීම හේතුවෙන් එම තත්ත්වය වර්ධනය කර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි. | කර්මාන්තශාලාවේ බලශක්ති නිෂ්පාදනය සිදුකරනු ලබන්නේ උක් ඇඹරීම සිදුකරන දින වලදී පමණක් බව ද 2016 වර්ෂයේදී උක් මෙ.ටොන් 416,340 ක් පමණ ඇඹරීමට ලක්කොට ඇති අතර 2020 වර්ෂය වනවිට එය මෙ.ටොන් 323,106 ක් දක්වා අඩුවී ඇති අතර එම නිසා ඊට සාපේක්ෂව ඇඹරුම් දින ගණන් ද අඩුවී ඇති බැවින් විදුලි උත්පාදනයද අඩුවී ඇති බව. | උක් ඇඹරීමේ ප්‍රතිශතය වැඩිකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සෙවනගල අංශයේ කාබන්ඩයොක්සයිඩ් වායුව අලෙවිය වෙනුවෙන් 2015 හා 2016 වර්ෂයන්හි ලැබිය යුතු රු.7,473,696 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හා වසර 06 ක කාලයක් තිස්සේ අලෙවි මිල සංශෝධනය කර ගැනීමටත්, නිෂ්පාදිත කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය මැනීම පිණිස මීටරයක් සවි කිරීමටත් කටයුතු නොකිරීම හේතුවෙන් කාබන්ඩයොක්සයිඩ් අලෙවියෙන් සමාගමේ ආදායම් වර්ධනය කර ගැනීමට විධිමත්ව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | ගිවිසුම් ප්‍රකාරව මෙම ගැණුම්කරු වෙත දින 60 ක ණය කාල සීමාවක් ලබා දී ඇත. මෙම යන්ත්‍රාගාරය ආරම්භ කර ඇත්තේ 2015 වර්ෂය අගභාගයේ දී වන බවද ඒ අනුව ප්‍රමාණවත් මොලැසස් දහනයක් සිදුනොවීම මත 2015/2016 වර්ෂයේ දී එම ආයතනයට අලාභයක් සිදුවී ඇති බවද පවසමින් රු. 7,473,696.48 ක් සඳහා මෙතෙක් මුදල් ගෙවා නොමැති අතර ඉතිරි මුදල් නිසි ලෙස අයකර ගෙන ඇති අතර 2021 දෙසැම්බර් මස 01 දින සිට Co2 කිලෝ එකක් රු.32 බැගින් අලෙවිය සඳහා කටයුතු කර ඇති අතර දැනට මෙම Co2 බර මත ගණනය කිරීම සිදුකරන අතර මේ සඳහා සුදුසු මීටරයක් සවිකිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලා කටයුතු කරනු ඇති බව. | මිල සංශෝධනය කර ගැනීමටත්, නිෂ්පාදිත කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය මැනීම පිණිස මීටරයක් සවිකිරීමටත්, අයවිය යුතු මුදල් අයකර ගැනීමටත්, ගිවිසුම්ගත ආකාරයට කටයුතු කිරීමටත් පියවරගත යුතුය. |
| (ඈ) | පැල්වත්ත අංශය 2013 වර්ෂයේදී කල් බදු පහසුකම් යටතේ රු.128,910,000 ක් වටිනාකමක් සහිත ක්‍රේන් යන්ත්‍රයක් මිලදීගෙන ඒ සඳහා රු.120,750,000 ක මුදලක් ගෙවා ඊට අවශ්‍ය විදුලිය සැපයීමට ද රු.2,254,850 ක් වැය කර තිබුණි. එසේ වුවද, සැපයුම්කරු විසින් එකඟ වූ පරිදි එම යන්ත්‍රය කර්මාන්තායතනය තුළ ස්ථාපිත නොකිරීම හේතුවෙන් මිලදීගත් දින සිට කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකිව රු.123,004,850 ක ප්‍රාග්ධන පිරිවැයක් දැරූ මෙම වත්කම නිෂ්කාර්යව පවතින අතර මෙම අනාර්ථික වියදමට වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන ඒ අයට එරෙහිව විනය පියවරක් ගෙන නොතිබුණි. | කර්මාන්තශාලාවට උක්දඬු ඇතුල් කිරීම සඳහා මිලදීගෙන මාස 03 ක් වැනි කාලයක් තුළ බිඳ වැටීමට ලක් වූ මෙම ක්‍රේන් යන්ත්‍රය අළුත්වැඩියාවන් සිදු කළ නමුත් එය සාර්ථක නොවූ අතර යන්ත්‍රයේ එක් කොටසකට අදාළ පිරිවැය රු.11,812,500 ක මුදල සඳහා කල්බදු වටිනාකම ගෙවීම අත්හිටුවා ඇති බවද මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන අංශය විමර්ශනයක් සිදු කළද අවසාන තීරණයක් ලබාදී නොමැති බව සහ 2023 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා අදාළ සැපයුම්කරු සමග සාකච්ඡා කොට ගිවිසුමකට එළඹ ඇති අතර මෙම වසරේ මහ කන්නයේදී මාස 03 ක කාලයක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර කාර්යසාධනය ඉදිරිපත් කරන ලෙස කළමනාකාරිත්වය විසින් සැපයුම්කරුට දන්වා ඇති බව. | අභ්‍යන්තර විමර්ශනයක් මඟින් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, මූල්‍ය අපරාධ විමර්ශන අංශයේ විමර්ශන කටයුතුවල ප්‍රගතිය සොයා බලා එය ආපසු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | සෙවනගල අංශයේ කර්මාන්තශාලාවේ අවශ්‍යතාවය සඳහා රු.11,412,646 ක මුදලකට 2018 වර්ෂයේදී ඉන්දියාවෙන් ආනයනය කරන ලද විද්‍යුත් චුම්භක බෙදුම් උපකරණ (Electro | මේ පිළිබඳ ව කම්හල් අංශයේ නිලධාරීන් ගෙන් විමසීම් සිදු කර ඇති අතර එම යන්ත්‍ර ස්ථාපිත කරවා ගැනීමට, අවශ්‍ය උපදෙස් හා කාර්යන් | යන්ත්‍රය ස්ථාපිත කර භාවිතයට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | Magnetic Separator) යන්ත්‍රය මේ දක්වා ස්ථාපිත කර නොතිබුණු අතර යෝග්‍ය තත්ත්වයෙන් පවතින බවට සමාගමේ ඉංජිනේරු විසින් සහතිකයක්ද නිකුත් කර නොතිබුණි. එසේම 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළමෙම ගෙවීම මිලදීගැනීම් අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර වර්තමානයේදීද මෙම වත්කම අභාවිතව පවතින බැවින් අදාළ වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | ඉටු කරවා ගැනීම සඳහා අදාළ උපකරණ ආනයනය කරන ලද ඉන්දියන් සමාගමේ නිලධාරීන් ගේ සහාය ලබා ගැනීමට අවශ්‍ය බව පවසන ලද බවද අදාළ යන්ත්‍රය ස්ථාපිත කිරීමෙන් පසු අත්තිකාරම් ගිණුම නිරවුල් කිරීමට කටයුතු කරනු ඇති බව. | |
| (ඊ) | රජයට පවරා ගැනීමට පෙර පැවති සෙවනගල සීනි කර්මාන්ත ආයතනය හා සෙවනගල ප්‍රජා සංවිධානය හා අන්‍යෝන්‍යාධාර සමිතිය සමඟ 2008 ඔක්තෝබර් 05 දින සිට 2009 ඔක්තෝබර් 04 දින දක්වා වසරක කාලයක් සඳහා ඇති කරගෙන තිබුණු ගිවිසුමක් අනුව සමාගමේ ජල මනුවෙන් එම අන්‍යෝන්‍යාධාර සමිතියට ජලය ලබාදී තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින දක්වා එනම් වර්ෂ 10 කට වැඩි කාලයක් තිස්සේ කිසිදු ලිඛිත ගිවිසුමකින් තොරව එම සමිතියට සමාගමේ ජල මනුවෙන්ම ජලය ලබා දී ඒ සඳහා 2008 වර්ෂයේ අත්සන් කළ ගිවිසුමෙහි ඇතුළත් මාසික ජල ඒකක ප්‍රමාණය උපරිම 1,325 ට යටත් ගාස්තු ප්‍රමාණය කිසිදු සංශෝධනයකින් තොරව 2020 වර්ෂය දක්වාම අයකරගෙන තිබුණි. | ඉදිරි වර්ෂවලදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලිඛිත ගිවිසුමක් මඟින් සමිතියට සමාගමේ ජල මනුවෙන් ජලය ලබා දිය යුතුය. |

## 3. වෙනත් විගණන නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සීනි විකිණීම සම්බන්ධයෙන් සමාගමේ ටෙන්ඩර් මණ්ඩල සංයුතිය හා ටෙන්ඩර් මණ්ඩල සීමා අවම මිල යනාදිය ඇතුළත් කර විධිමත් ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් සකස් කර අනුමත කරවාගෙන නොතිබුණු අතර මෙට්‍රික් ටොන් 100 ත් 1,000 ත් අතර සියළු ප්‍රමාණයන් එනම් රු.10,510,000 ත් රු.130,410,000 ත් අතර වටිනාකම් වලට අදාළ සියලුම සීනි තොග අලෙවි කිරීම් දෙපාර්තමේන්තු ටෙන්ඩර් කමිටුව මඟින් සිදු කර තිබුණි. | ටෙන්ඩර් මණ්ඩල සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගෙන ඇති බවද සියලුම සීනි තොග අලෙවි කිරීම් දෙපාර්තුමේන්තු ටෙන්ඩර් කමිටුවේ සීමාවන්ට යටත්ව සිදු කරන බව. | විධිමත් ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් සකස් කර භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | රාජ්‍ය සේවයේ තනතුරකින් විශ්‍රාම ගිය නිලධාරියකුට මාසිකව රු.80,000 ක උපදේශක දීමනාවක්, රු.50,000 ක ප්‍රවාහන දීමනාවක් හා රු.15,000 ක ඉන්ධන දීමනාවක් ගෙවමින් 2018 පෙබරවාරි 15 දින සිට වසරක | සෙවනගල අංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත්කරන තෙක් අභ්‍යන්තර විගණන උපදේශකවරයාගේ සේවය ලබා ගැනීම සිදුකරන බව. | වැඩ බැලීමේ දීමනා ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII වැනි |

| | | | |
|---|---|---|---|
| | කාලයක් සඳහා අභ්‍යන්තර විගණන උපදේශකවරයෙකු වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව බඳවාගෙන තිබුණි. මෙම උපදේශකවරයා වෙත 2020 වර්ෂය සඳහා ගෙවූ දීමනාවල එකතුව රු.1,740,000 ක් වූ අතර 2020 වර්ෂය සඳහා ගෙවා තිබූ ප්‍රසාද හා දිරිදීමනාව රු.155,000 ක් විය. 2023 පෙබරවාරි 14 දින දක්වා වාර්ෂිකව කාලය දීර්ඝ කරගනිමින් මෙම උපදේශකවරයා සමාගමේ උපදේශන කටයුතු සිදුකරමින් පවතී. | | පරිච්ඡේදයේ සඳහන් උපදෙස් වලට අනුකූලව විය යුතුය. |
| (ඇ) | සමාගමේ සෙවනගල අංශයේ වැඩබලන සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන) ලෙස සේවයේ නියුතුව සිට 2019 සැප්තැම්බර් 05 දිනට වයස අවුරුදු 60 ක් සම්පූර්ණ වීම මත විශ්‍රාමගැන්වූ නිලධාරියෙකු මෙම සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි විසින් වසරක සේවා දිගුවක් හා ඉන් පසුව මාස 06 න් 06 ට කාලය දීර්ඝ කරමින් කර්මාන්තශාලා උපදේශක ලෙස අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව පත්කර රු.206,500 ක මාසික දීමනාවක්ද, රාජකාරී හා පෞද්ගලික ගමන් සඳහා පිළිවෙලින් කිලෝමීටර 1540 හා 1200 බැගින් ඉන්ධන සමඟ නිල වාහනයක් ද, ආයතනීය වෛද්‍යාධාර රක්ෂණ පහසුකම් ප්‍රසාද හා දිරිදීමනාවක් ද ගෙවා තිබුණු නමුත් ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතියක් ලබාගෙන නොතිබුණි. 2020 වර්ෂය සඳහා මුදලින් ගෙවා තිබුණු දීමනාවල මුළු එකතුව රු.2,436,047ක් වූ අතර 2020 වර්ෂයේදී දරන ලද මුළු ඉන්ධන වියදම රු.365,278ක් විය. | පළපුරුදු නිලධාරිවරයෙකුගේ සේවය අත්‍යාවශ්‍ය වූ බැවින් කර්මාන්තශාලා උපදේශකවරයාගේ සේවය ලබා ගැනීම සිදු කරන බවද ඉදිරියේදී මොහුගේ සේවය පිළිබඳව කළමනාකාරිත්වය විසින් තීරණයක් ගනු ලබන බව. | වැඩ බැලීමේ දීමනා ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ සඳහන් උපදෙස්වලට අනුකූලව විය යුතුය. |
| (ඈ) | සෙවනගල අංශය විසින් ප්‍රසම්පාදන කටයුතු වලදී ඇණවුම සමඟ එම ඇණවුමට අදාළ සම්පූර්ණ මුදලම අත්තිකාරම් වශයෙන් ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරමින් පවතින අතර භාණ්ඩය හෝ සේවය නිසි පරිදි ලැබී ඇති බවට සහතික නොකිරීම හා පියවා ගැනීම සඳහා අවධානය යොමු නොකිරීම මත හා අදාළ භාණ්ඩ හෝ සේවා ලද විගස එම අත්තිකාරම් පියවීමටද කටයුතු කර නොතිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල ඒ ආකාරයට ලබා දෙන ලද රු.12,965,197 ක නොපියවූ අත්තිකාරම් ශේෂයක් පැවති අතර ඉන් සැපයුම්කරුවන් 28 දෙනෙකුට ලබාදෙන ලද රු.8,753,214 ක අත්තිකාරම් මුදල් වසර 01 සිට වසර 08 දක්වා නොපියවූ අත්තිකාරම් බව නිරීක්ෂණය විය. | පසු විපරම් කර, ඉදිරි වර්ෂයේදී මෙම අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | නොපියවූ අත්තිකාරම් පිළිබඳව කඩිනමින් සොයා බලා පියවා ගැනීමටත්, මිලදී ගැනීම් සම්බන්ධ විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇති කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පැල්වත්ත ඒකකය තුළ ගොල්ෆ් ක්‍රීඩාංගනයක් පවත්වාගෙන යාම සඳහා වූ නඩත්තු හා සේවක වැටුප් ගෙවීම සඳහා 2018, 2019 හා 2020 වර්ෂ වලදී පිළිවෙලින් රු.6,232,595 ක් , රු.6,618,127 ක් හා රු.10,751,622 ක් වැය කර තිබුණි. එසේ වුවද , මෙම ක්‍රීඩාංගනයෙහි කිසිදු ගොල්ෆ් ක්‍රීඩාවක් සිදු නොකිරීම හේතුවෙන් වැයකර ඇති වියදම් නිශ්කාර්ය වී ඇති බව නිරීක්ෂණය විය. | මෙම ගොල්ෆ් ක්‍රීඩාංගනය නඩත්තු කිරීම සඳහා වැයකර ඇති මුදල තුල එම අංශයේ සේවය කරන සේවකයින්ගේ වැටුප් සහ දීමනා ප්‍රධාන වශයෙන් අන්තර්ගත වන බවද රජයට පවරා ගැනීමෙන් පසුව ගොල්ෆ් ක්‍රීඩාංගනය භාවිත නොකලද එහි නඩත්තු කටයුතු කරගෙන යාමට සිදුවූ අතර 2023 වර්ෂයේදී කළමනාකාරීත්වය විසින් මෙම අංශයේ සේවකයින් වෙනත් ඵලදායි අංශ වෙත මාරුකර අදාළ වියදම් කපාහැරීමට කටයුතු කර ඇති බව. | මෙම ක්‍රීඩාංගනය උපයෝජනය පිණිස සැලසුම් සකස් කළ යුතුය. |
| (ඊ) | පැල්වත්ත එකකයේ රු.12,664,305 ක් වටිනා වාහන 9 ක් 2013, 2016 හා 2019 වර්ෂයන්හි අලුත්වැඩියාවන් සඳහා ආයතනයේ ගරාජය වෙත යොමුකර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අලුත්වැඩියා කටයුතු නිමකර නොතිබුණි. | අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කර තිබූ ආයතනයට අයත් වාහන 09 අතුරින් එක් වාහනයක් දැනට අලුත්වැඩියා කටයුතු අවසන් කරමින් පවතින අතර අමතර කොටස් සොයා ගැනීමට අපහසුව නිසා අනෙක් වාහන එම තත්ත්වයෙන්ම පවතින බව. | වාහන අලුත්වැඩියා සාධාරණ කාලයක් ඇතුළත සිදු කර ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | පැල්වත්ත ඒකකය සතු රු.34,228,844 ක් වටිනා වාහන 123 ක් 2010, 2011, 2014 හා 2019 වර්ෂවල සිට අක්‍රියව පැවති අතර ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණි. | ආයතනයට අයත් වාහන 123 ක් අක්‍රීයව පවතින බව ප්‍රවාහන අංශය මගින් සඳහන් කර තිබුණ ද මේවා ආයතනයේ වත්කම් ලැයිස්තුවෙන් ඉවත් කිරීම සඳහා අධ්‍යක්‍ෂක මණ්ඩල අනුමැතියක් ලබාගැනීමට කටයුතු නොකිරීම නිසා ඒවා තවමත් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් වන බවද ඉදිරියේදී අදාළ අනුමැතීන් ලබාගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අක්‍රියව පවතින වාහන සමාගමට වාසිදායක වන ආකාරයට අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම කළ යුතුය. |
| (ඌ) | සෙවනගල අංශය වෙතින් උක් වගාව සඳහා ණය ලබාගත් ගොවින් උක් වගාවෙන් බැහැර වී වෙනත් අනවසර බෝග වගාවන් සඳහා යොමු විම හේතුවෙන් ගොවීන් 277 කගෙන් අයවිය යුතු එකතුව රු.12,779,215 ක ණය ශේෂ අයකර ගැනිමට හා ගොවීන් නැවත උක් වගාවන් සඳහා යොමු කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. මෙම ණය වලින් රු. 4,333,617 ක් වසර 05කට වැඩි කාලයක සිට ද රු. 6,807,144 ක් වසර 3 ත් 5 ත් අතර කාලයකට ද අයත් විය. | 2020 දෙසැම්බර් 31 දිනට උක් වගාව නොමැති ඉඩම් කට්ටි 277 ක ණය ශේෂයන් මේ යටතේ සැලකිල්ලට ගෙන ඇති බවද මෙම ඉඩම් අතරින් නැවත උක් සිටුවීම සඳහා ඉඩම් සකස් කරමින් තිබෙන උක් ඉඩම් හා ශෂ්‍ය මාරු වගාවට යොමු කරන ලද ඉඩම් කැබලි ඇතුලත් වන අතර එම ඉඩම් වල යළි උක් වගා කිරීමට මාස කිහිපයක් හෝ වර්ෂයක පමණ කාලයක් ගත වුවත්, උක් වගා කර ඊලඟ වර්ෂයේදී කම්හල වෙත උක් සැපයීමෙන් පසු ණය අයකර ගැනීමේ හැකියාවක් ඇති බවද මීට අමතරව අනවසර වගාවන් හා ඉදිකිරීම් සිදුකර ඇති ඉඩම් | මුළු ඉඩම් ප්‍රමාණයම වගා කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | සම්බන්ධයෙන් මේ වන විට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින බව. | |
| (එ) | සෙවනගල අංශය විසින් කාරක ප්‍රාග්ධනය මැනැවින් කළමනාකරණය නොකිරීම හේතුවෙන් දිගින් දිගටම බැංකු අයිරාවන් ලබාගෙන අයිරා පොලී ගෙවීමට සිදු වී තිබුණි. 2020 වර්ෂයේ අයිරා පොලිය රු.7,503,484 ක්ද, 2019 හා 2018 වර්ෂයන්හි පිළිවෙළින් රු.7,520,809 ක් හා රු.11,969,695 ක්ද විය. බැංකු ණය හා බැංකු අයිරා පහසුකම් ලබාගැනීම සඳහා සෙවනගල අංශය සතු රු.285,000,000 ක ස්ථාවර තැන්පතු 07 ක්ද ඇපයට තබා තිබුණි. | ආයතනයේ දෛනික සිදුකල යුතු මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සම්පූර්ණ නොවන අවස්ථා වලදී බැංකු අයිරා පහසුකම් ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | කාරක ප්‍රාග්ධනය මැනවින් කළමනාකරණය කිරීම කළ යුතුය. |
| (ඒ) | 2020 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුව ඇඹිලිපිටිය ශාඛාවේ පවත්වාගෙන යන ජංගම ගිණුමක 2012 වර්ෂයේ සෙවනගල අංශය රජයට පවරා ගන්නා අවස්ථාවේ සිට පැවති රු.4,958,247 ක ශේෂය මේ දක්වා නිෂ්ක්‍රීයව පවතින අතර මෙම මුදල ඵලදායි ලෙස ආයෝජනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඵලදායි ලෙස ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | සෙවනගල අංශය සතු වාහන 106 කින් වාහන 14 ක් එම අංශය සතුව නොපවතින බවත් පෞද්ගලික ආයතනයක් විසින් රැගෙන ගොස් ඇති බවත් විගණනය වෙත කරුණු ඉදිරිපත් කර තිබුණු අතර වාහන 75 ක් ධාවනය කිරීමට නොහැකිව සෙවනගල භූමියේ දිරාපත් වෙමින් පවතින බවට ද විගණනයට නිරීක්ෂණය විය. | නෛතික ගැටළු හේතුකොට ගෙන මෙම වාහන අළුත්වැඩියා කර ධාවනය කිරීමේ හැකියාවක් නොමැති අතර වාහන අමතර කොටස් සඳහා ද අධික පිරිවැයක් දැරීමට සිදුවන වන බව යාන්ත්‍රික ඉංජිනේරුවන් විසින් කරුණු කළමණාකාරිත්වය පැහැදිලි කිරීම් සිදුකර ඇති බව. | යල්පැන ගිය තොග සමාගමට වාසිදායක වන ආකාරයට අපහරණය කළ යුතුය. |
| (ඕ) | සෙවනගල අංශය විසින් 2018 වර්ෂයේදී ඉන්දියාවෙන් රු.9,564,866 ක වටිනාකමක් සහිත වාෂ්පීකරණ යන්ත්‍රය (Evaporator) ආනයනය කර රු.3,924,394 ක රේගු ගාස්තුවක් ගෙවා තිබුණි. ඒ සඳහා වන උපාංග (SS Tube) පිරිවිතර වලට එකඟ නොවීම මත ආපසු යවා 2019 වර්ෂයේදී නැවත ආනයනය කිරීමේදී ගෙවා තිබුණු රු.4,830,446 ක රේගු ගාස්තුව සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් එම වටිනාකම සමාගමට පාඩුවක් වී තිබුණු අතර එම රේගු ගාස්තුව ගෙවීමට අදාළ ලියකියවිලි සමාගම සතුව නොතිබීම හේතුවෙන් එම වටිනාකම ද විදේශීය ඇනවුම් අත්තිකාරම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | නැවත ආනයනය කිරීමේදී ගෙවා තිබුණු රු. 4,830,446 ක රේගු ගාස්තුව සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | රේගු ගාස්තුව සැපයුම්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | පැල්වත්ත අංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත 2012 වර්ෂයේ සිට ගොවි ණය සඳහා අයකරන සියයට 12 ක පොලී ආදායමෙන් සියයට 3 ක් ගොවීන්ගේ සුභ සාධනය සඳහා ද, සියයට 1 ක් ආයතනයේ සුභ සාධන කටයුතු සඳහා ද වෙන් කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ගොවීන්ගේ සුභසාධන ගිණුම රු.104,595,757 ක්ද, ආයතනයේ සුභ සාධන ගිණුම රු.34,930,417 ක්ද විය. එසේ වුවද, 2012 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා එලෙස වෙන් කරන ලද මුදල් වලින් කිසිදු සුභ සාධනයක් කර නොතිබුණි. | ආයතනය විසින් ගොවි ණය සඳහා 12% පොලී මුදලක් අයකළ අතර 2012 වසරේදී එවකට ආයතනයේ පාලන අධිකාරිය විසින් මෙම පොලී ආදායමින් 3% ක් ගොවින්ගේ සුභ සාධනය සඳහාත් 1% ක මුදලක් ආයතනයේ සුභ සාධනය සඳහාත් වෙන්කරන ලෙස මූල්‍ය අංශයට දැනුම්දී ඇති බවද ඒ අනුව 2012 වසරේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා අදාළ වෙන්කිරීම් ගිණුම් වාර්තාතුල සිදුකර ඇති අතර 2021 වසරේදී ගොවි ණය සඳහා වන පොලී අනුපාතය 8% දක්වා අඩුකිරීම සඳහා අධ්‍යක්‍ෂක අනුමැතිය ලැබීමත් සමග ඉහත වෙන්කිරීම නතර කරනු ලැබූ බව සහ 2022 ඔක්තෝබර් 13 වන දින පැවති අධ්‍යක්‍ෂක මණ්ඩල රැස්වීමේදී ලද අනුමැතිය පරිදි මෙලෙස වෙන්කරන ලද මුළු මුදල නැවත ආයතනයේ ආදායමට එකතුකිරීමට කටයුතු කර ඇති බව. | සුභසාධනය වැඩළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ග) | 2020 වර්ෂය අවසානයට සමාගම සතු වාහන 469 ක් සමාගම නමින් ලියාපදිංචි වී නොතිබුණු අතර 2011 වර්ෂයේ රජයට පවරා ගැනීමට පෙර පැවති සමාගම්වල කොටස්කරුවන්ගේ නම් වලින් හා පෞද්ගලික ආයතනවල නම් වලින් එම වාහන ලියාපදිංචි කර තිබුණි. | මෙම වාහන 469 ආයතනය රජයට පවරාගැනීමට පෙර මිලදීගත් ඒවා වන අතර ඒවා එවකට පැවති ආයතනයේ නමින් සහ ආයතනයේ හිමිකරුවන්ගේ නම් වලින් මිලදීගෙන ඇති බවද මෙම වාහන වල අයිතිය ලංකා සීනි සමාගම වෙත පැවරීම සඳහා මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර ඇතත් යම් යම් නෛතික කරුණු මත එම දෙපාර්තමේන්තු විසින් අදාළ අයිතිය පැවරීම සිදුකර නොමැති බව. | සමාගම සතු වාහන සමාගම නමින් ලියාපදිංචි කරගත යුතුය. |
| (ච) | සෙවනගල අංශයේ භාවිතයෙන් ඉවත් කර ඇති ට්‍රැක්ටර් රථවලට අදාළ රු.34,718,160 ක් වටිනා අමතර කොටස් අයිතම 3,585 ක් සමාගමේ වෙනත් වාහනවලට යොදා ගැනීමට හෝ විකිණීමට කටයුතු නොකර වසර 05 කට වඩා වැඩි කාලයක සිට ගබඩාකර තිබුණි. | භාවිතයෙන් ඉවත් කරන ලද ට්‍රැක්ටර් රථ අමතර කොටස් 3,585 ට අදාළව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් නෛතික සීමා බලපා ඇති බව. | සමාගමේ වෙනත් වාහනවලට යොදා ගැනීමට හෝ විකිණීමට කටයුතු කළ යුතුය. |